www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# අයිස්ලන්තය : අනාගතයේ අසුබ පෙරනිමිත්තක්

**Iceland: A portent of the future**

**ක්‍රිස් මාස්ඩෙන් විසිනි**
**2008 නොවැම්බර් 29**

අයිස්ලන්තය සමාජීය සහ ආර්ථික වශයෙන් බරපතල ව්‍යසනයකට මුහුන දෙමින් සිටී. එහි 300,000 වූ ජනතාව ලෝක ව්‍යාප්ත මූල්‍යමය අර්බුදයේ ඕනෑම දියුනු රටක් මුහුනදෙන වඩාත්ම දරුනු සහ ක්ෂනික ප්‍රහාරයකට ලක්වී තිබේ.

එම හේතුව නිසාම, අයිස්ලන්තයේ සිදුවීම් බොහෝ විශාල රටවල සහ ජාත්‍යන්තර වේදිකාවේ අනිවාර්යයෙන්ම දිගහැරිය යුතු වර්ධනයන් වල අසුබ පෙරනිමිති සපයයි.

දරුනු කඩාවැටීමකට සමස්ථ ආර්ථිකයම ඇදදමමින් අයිස්ලන්තයේ බැංකු පද්ධතිය කඩාවැටී ඇත. ඔක්තෝම්බර් මාසයේ දින හතක කාල පරාසය තුල එහි ප්‍රධාන බැංකු තුනම බංකොලොත් වූ අතර ආන්ඩුවට පෙරට පැමින ඒවා බාර ගැනීමට බලකෙරිනි. පුද්ගලයන්, සමාගම්වල විශ්‍රාම වැටුප් අරමුදල්, ප්‍රාදේශීය ආන්ඩු, පුණ්‍යාධාර ආයතන සහ පොලිස් සේවාවන් විසින්, ආයෝජනය කරන ලද මිලියන සිය ගනනක් ආපසු ඉල්ලා බල කිරීමේ උත්සාහයකදී බ්‍රිතාන්‍යයේ බ්‍රවුන්ගේ ලේබර් ආන්ඩුව ත්‍රස්ත විරෝධී නීති පාවිච්චි කලේය. ඒ බොහෝ දේ ආපසු නොලැබෙනු ඇත.

මූලිකවම, සියයට 15 ඉක්මවා තිබූ උද්ධමන රේට්ටුවට බැංකු රේට්ටු සම්බන්ධ කරමින් භූගෝලීයව විශාල ලාභ සහිත ආයෝජනයන් සඳහා මධ්‍යස්ථානයක් වන්නට ගත් අයිස්ලන්ත උත්සාහයන් මෙම පාඩුවීම්වල පරිමාවට හේතු විය. අනෙකුත් තැන්වල ලබා දෙන රේට්ටුවලට වඩා සියයට 50කින් වැඩි රේට්ටු බොහෝවිට එහි බැංකු විසින් ප්‍රදානය කෙරින.

එහි උපරිමයේදී, තම දල දේශීය නිෂ්පාදනය මෙන් දස ගුනයක වටිනාකම් සහිත විදේශ දේපල අයිස්ලන්ත බැංකු අත්පත්කරගත් අතර එවන් බොහෝ ආයෝජන ජාත්‍යන්තර නයදීම් මගින් සුරක්ෂිත කෙරිනි. පවත්වා ගෙන යා නොහැකි නය සහිත පිරමීඩ ක්‍රමයක් මත ගොඩනැංවූ දැවැන්ත විශාල ලාභ සහිත බුබුලකින් එය පෙන්නුම් කෙරිනි.

අයිස්ලන්තය ප්‍රබලලෙසම බංකොලොත් වී ඇති අතර බොහෝවිට තම දැවැන්ත නය කන්දරාව ගෙවාගත නොහැක. විදේශ නය ප්‍රදානය කරන්නන් විසින් දැන් ලබා ඇති පාඩුවීම් ඩො. බිලියන 40ට වැඩි බවට ගනන් බලා ඇත. උදාහරනයක් ලෙසට ලැන්ඩ්ස්බැංකි හි අන්තර්ජාල බැංකු සේවය වන අයිසේව් එක්සත් රාජධානියේ ඩො. බිලියන 6.75 වැඩි ආයෝජනයක්ද නෙදර්ලන්තයේ ඩො. බිලියන 1.5 ආයෝජනයක්ද ආකර්ෂනය කරගත්තේය. රටවල් දෙකම එම මුදල් ආපසු ඉල්ලා සිටින අතර එම නය අයිස්ලන්තයේ මුලු ද.දේ.නි. යට වඩා වැඩිය. ලන්ඩන් ආර්ථික පාසලේ මූල්‍ය කියවන්නෙක් වන ජොන් ඩැනියෙල්සන් පෙන්නා දෙන ලෙසට, "සසඳබැලීමේදී, පලවන ලෝක යුද්ධයට පසුව ජර්මනියෙන් ඉල්ලා සිටි වන්දි ගෙවීම්වල මුලු අගය ද.දේ.නි. යෙන් සියයට 85 කට ආසන්න අගයක් විය."

මූල්‍ය ආධාර ලෙස ඩො. බිලියන 10 ක් ලබා ගනිමින් අයිස්ලන්තය නය නොගෙවීම් කල් දමා ගත්තේය. 1976 දී බ්‍රිතාන්‍යයට පසුව සංවර්ධිත රටක් එවැනි ආධාරයක් ලැබූ පලමු අවස්ථාව ජා.මූ.අ. න් ඔවුන් ලැබූ ඩො. බිලියන 2.1 ක නය මුදල විය. මෙය සමග දුගී බවින් මිරිකුනු අප්‍රිකානු සහ ආසියානු බොහෝ රටවලට වේදනාකාරී වුනු ව්‍යුහාත්මක වැඩසටහන්ද පැමිනෙන අතර එමගින් භූගෝලීය නය "නඩත්තු" කරගත හැක. ඊට අමතරව, සම්පූර්න ආර්ථික කඩාවැඩීමේ කම්පනයකට බියෙන් අනෙකුත් යුරෝපීය රටවල් පොරොන්දුවූ අමතර නයද සමග ස්වීඩනය, නෝර්වේ, ඩෙන්මාර්කය සහ ෆින්ලන්තය ඩො. බිලියන 25 ක් නයට දුන්නේය.

ආර්ථිකය දියවෙමින් පවතී. දේශීය මුදල් වටිනාකමට අනුව ද.දේ.නි. සියයට 15 කින් හැකිලී ඇති ලෙස පෙනෙන නමුත් ක්‍රෝනා අගයේ කඩාවැටීම නිසා යූරෝ මුදලට සාපේක්ෂව එය සියයට 65 ක් වේ. අයිස්ලන්ත මුදල් අන්තර්ජාතික වෙලඳමේ යෙදවිය නොහැකි තරම්ය. ක්‍රෝනාහි අගය භාගයට බැස ඇති අතර උද්ධමනය මසක් ඇතුලත සියයට 1.74 කින් නගිමින් සියයට 17.1 කට ලඟා වී ඇත. සියයට 30 කින් ආහාර ද්‍රව්‍ය මිල ගනන් ඉහල යාමත් සමග අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය වඩා වේගයෙන් ඉහල නැගුනි.

කම්කරුවන් දහස් ගනනින් අතිරික්ත වෙමින් සමාගම් සැමදාම වැසී යනු පෙනේ. ජනගහනයෙන් තුනෙන් එකක පමන තම ඉතිරිකිරීම් සියල්ල හෝ

වැඩිප්‍රමාණයක් නැතිවී ඇතැයි විශ්වාස කෙරේ. තත්වය කෙතරම් නරක අතට ගොස් ඇතිදැයි කිවහොත් සමීක්ෂනවලදී ප්‍රතිචාර දැක්වූවන්ගෙන් තුනෙන් එකක්ම පැවසූයේ ඔවුන් රට හැරදායෑමට සලකාබලමින් සිටින බවයි. රැකියා දක්ෂතා සහිත බොහෝ තරුන ජනතාව දැනටමත් රටහැර යමින් සිටිති.

සන්ධාන ආන්ඩුවේ නිදහස් පක්ෂය සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සභාගයට සහ ජා.මූ.අ. යන පාර්ශව දෙකටම එරෙහිව අගනගරය වන රෙක්ජාවික්හි නිරන්තරව සිදුවන දේශපාලන විරෝධතා වලට පසුබිම මෙයයි.

අයිස්ලන්තයේ ඉරනම සම්බන්ධව මාධ්‍ය සහ පාලක කවවල සැලකිලිමත්වීම පැහැදිලිය. හෆින්ටන් පෝස්ට් වලට ලියමින් මැක්ස් කෙයිසර් මෙසේ අසයි. " අයිස්ලන්තයේ විප්ලවය ගැන අනාවැකි කියන්නට හැකිවුනේ කාටද?"

පෙර සිදුවූ යමක් ඔහු වාර්තා කරයි. "1780 ගනන්වල ප්‍රංශයේදී සිදුවූවා මෙන් භූගෝලීය නය බුබුල පිපිරුනහොත් මිනිසුන් කෝපයෙන් නැගී සිටිනු ඇත්දැයි මම කවුප්තින් බැංකුවේ පර්යේෂන අංශයේ ප්‍රධානියාගෙන් විමසූවෙමි. ඔහු එම ප්‍රශ්නය ගැන සිනාසුනා. අද අයිස්ලන්ත ජනතාව වචනානුසාරයෙන්ම විප්ලවය සඳහා කතා කරනවා."

ආයෝජන ජර්නලයක් වන *Fall Street.com* මෙම ප්‍රශ්නයම ඉදිරිපත් කරයි. "අයිස්ලන්තය ආර්ථික අරාජිකතාවයෙන් සහ විප්ලවයෙන් යුක්ත වූ තත්වයකට පත් වේයැයි කවුරු හෝ සිතුවා ද?"

කෙසේවුවද, බියජනකභාවයන් අයිස්ලන්තයේ ආර්ථික සහ දේශපාලන ඉරනමට වඩා පලල්ව පැතිරෙයි. "විශාල බැංකු කේෂ්ත්‍ර සහිත කුඩා රාජ්‍යයන් තුල මෙවැනිම සිද්ධීන් සිදුවීම වැලැක්වීමට යුරෝපියානු නායකයන් වහාම ක්‍රියාමාර්ග ගතයුතු බව" ඩැනියල්සන් අවධාරනය කරයි.

හංගේරියාව දැනටමත් ජා.මූ.අ. න් ඩො. බිලියන 16 ක් සහ යුරෝපීය සංගමයෙන් ඩො. බිලියන 8 ක නයක් ගැනීමට සාකච්ඡා කරමින් සිටී. මේ නය සමග බැඳුනු ඉල්ලීම් වනුයේ සේවා කප්පාදු කිරීම්, රැකියා සහ විශ්‍රාම වැටුප් වල දැවැන්ත කපාහැරීම්, වැටුප් එකතැන පල්කිරීමෙන් පැගෙන කම්කරුවන් සහ වේතනයෙන් සියයට 8 ක් පමන වන වාර්ෂික බෝනස් නැතිවීම් වේ. යුක්රේනය ජා.මූ.අ. න් ඩො බිලියන 16.5 ක නයක් ලබාගෙන ඇති අතර බෙලාරුසියාව, සර්බියාව, රොමේනියාව, ලැට්වියාව, එස්තෝනියාව සහ ලිතුවේනියාව වාර්තාවන ලෙසට උනන්දුවෙන් නය ඉල්ලූ රටවල්වේ.

අයර්ලන්තයද, අයිස්ලන්තය ගමන් කල මාර්ගයේම යනු ඇතැයි අනාවැකි පල කෙරේ. *All news web Ireland* මෙසේ වාර්තා කරයි. "මහා පරිමානව පල්ලම් බැසීමට පටන් ගන්නා ඊලග යුරෝපියානු ජාතිය අයර්ලන්තය වීමට බොහෝ ඉඩකඩ ඇති බව පෙනේ. අයර්ලන්ත දේපල වෙලඳපොල අධික ලෙසට ඉහල වටිනාකම් ලැබී ඇති අතර නය මට්ටම් අහස උසට නැග ඇත. තමන්ට ජීවත්වීමට නොහැකි වන බවට මිනිසුන්ට තේරුම් යන විට සහ එ.ජ. යෙන් එන ආයෝජන වේලී යන විට, බුබුල පුපුරා යනු ඇතැයි අයර්ලන්ත බැංකු අංශයේ ජේෂ්ඨ ආර්ථික උපදේශක ෂෝන් මැකාති තර්ක කරයි. "දේපල බුබුලේ හුලං යන විට බිය සංකා වැඩේවි. දෙවියෝ අයර්ලන්තය බලාගනිත්වා."

ආයෝජන සම්බන්ධ අන්තර්ජාල අඩවියක් වන *Credit Writedowns* මෙසේ ලියයි. "තම බැංකු තැන්පත්කරුවන්ට ස්ථිරසාර සහතිකයක් දුන් පලමු රට අයර්ලන්තයයි. රට සතුව පමනට වඩා විශාල මූල්‍ය අංශයක් පැවතීම අයර්ලන්ත රජයට පවා සහතිකවීමට නොහැකි තත්වයක පැවතුනි." එබැවින් "අයිස්ලන්ත ඉරනම දක්වා ගෙන යා හැකි කඩාවැටෙන සුලු අයර්ලන්ත බැංකු පද්ධතිය ගැන බියජනක බවෙහි උප-ප්‍රවනතාවක් ඇතැයි පෙනෙන්නට තිබේ."

සමාජ සහ දේශපාලන අසහනයක් කරා දිවෙන ජාතික බංකොලොත්භාවයේ බියෙන් වෙලීම, වැඩිලෙසටම, කුඩා ජාතීන්ට සීමා වන්නක් නොවේ. ලොවේ පස්වන විශාලතම ආර්ථිකය හිමි එක්සත් රාජධානියටද ඒ සමාන ඉරනමක් ලගාවෙමින් පවතින බවට බරපතල සාකච්ඡා සිදුවේ.

නොවැම්බර් 22 ටයිම්ස් පුවත්පතේ පැට්‍රික් හොස්කින් මෙසේ ඇසුවේය. "බ්‍රිතාන්‍යය සරල ලෙසටම අයිස්ලන්තයේ විශාල අනුවාදයක්ද? ඇත්තටම ලන්ඩන් නගරය උස ගොඩනැගිලි හා සුලු ප්‍රමානයක් කොඩ් සමග වුවද රෙක්ජාවික් නගරයට බොහෝ සමාන ලෙසට පෙනෙන්නට පටන්ගෙන ඇත.

නියම තත්වය නම්, දේශීය බැංකු විශාල ලෙස පුපුරනවා. ආන්ඩුවේ පවුම් බිලියන 500 ඇපදීමේ සැලසුම මූලිකවම නිර්මානය වුනේ කුඩා ආයතන සහ නිවාස මිලදී ගන්නන්ට බැංකු නයදීම් පවත්වාගෙනයාමට නොව, සිතාගන්නට පවා අසීරු මූල්‍යමය ව්‍යසනයක් වලක්වා ගන්නටයි."

අශුභ පෙරනිමිති සහිත අනතුරු ඇඟවීමක් කරමින් හොස්කින් ලිපිය සමාප්ත කරයි. "මුලුමහත් ආර්ථිකයේම අත්තිවාරම සහ ස්ථිරසාරත්වය බැංකු විසින් සම්පාදනය කෙරේ. ඔවුන් ගැන විශ්වාසනීයත්වය බිඳවැටීම මුලුමහත් ධනවාදී මන්දිරයම කඩාවැටීමක් දක්වා ගෙන

යා හැක. අතිශෝක්තියේ අවදානමේදී, සිල්ලර වෙලඳමට මෙය පාඩුදායී නත්තලක් වනු ඇතැයි අප කනගාටු නොවිය යුතු නමුදු, මහා විරැකියාවෙන් සහ සමාජ අසහනයෙන් සපිරුනු වසර ගනනාවක් පුරා ඇදෙන ආර්ථික අඳුරු කාල පරිච්ඡේදයකට බ්‍රිතාන්‍යය සහ බටහිර තල්ලුවෙන බව පෙනේ."

දිගහැරෙමින් පවතින භූගෝලීය ආර්ථික අර්බුදයේ ඇඟවීම්වල එවැනි තේරුම් ගැනීම්, ජාත්‍යාන්තරව කම්කරු ව්‍යාපාරය දේශපාලන නැවත ඉපදීමකට සහ උනන්දුවීමකටද, ලාභ පදනම අහෝසි කිරීම සඳහා සමාජවාදී වැඩපිළිවෙලක් මත තම නව-දිශානවතියක යලි හැඩගැස්මකටද ආරම්භය හා සැකැස්ම සනිටුහන් කල යුතුය.

© www.wsws.org